කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : 01 WW/L/23/12/01/01
වර්ණය : ඇම්බර්

# තද වැසි සහ තද සුළං පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් **2023 දෙසැම්බර් මස 01** වන දින පෙ.ව. 10.00 සිට **2023 දෙසැම්බර් මස 02** වන දින පෙ.ව. 10.00 වන තෙක් වලංගු වන පරිදි **2023 දෙසැම්බර් මස 01** වන දින පෙ.ව. 10.00 ට නිකුත් කරන ලදී.

## උතුරු, උතුරු මැද, නැගෙනහිර සහ වයඹ පළාත් සඳහා

## සැලකිලිමත් වන්න!

**ගිනිකොන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය මේ වන විට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ඇත. එය 2023 දෙසැම්බර් 02 දින වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී 2023 දෙසැම්බර් 03 දින වන විට සුළි කුණාටුවක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇත. මෙම පද්ධතිය, ශ්‍රී ලංකාවේ උතුරු වෙරළට ආසන්නයෙන් බටහිරට බරව වයඹ දෙසට ගමන් කර උතුරු තමිල්නාඩු වෙරළ තීරයට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ.**

මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන්, වැසි සහ සුළං සහිත කාලගුණ තත්වයක් උතුරු සහ උතුරු මැද පළාත්වලත් ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් බලාපොරොත්තු වේ, ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

උතුරු, උතුරු මැද සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත්, විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ තද සුළං බලාපොරොත්තු වේ.







| | | |
|---|---|---|
| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |